**වෙළෙඳ,වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය**

**ජාතික සමුපකාර සංවර්ධන ආයතනය - පොල්ගොල්ල**

**(1) . තනතුරු නාමය :- සහකාර ලේඛකාධිකාරි (පුරප්පාඩු - 01)**

**(2) . සේවා ගණය :- කළමනාකාර (MM 1-2)**

**(3) . අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද**

**බාහිර අයදුම්කරුවන්**

**අධ්‍යාපන**

I. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආර්ථික විද්‍යාව, රාජ්‍ය හෝ ව්‍යාපාර පරිපාලනය, කළමනාකරණය, මානව සම්පත් කළමනාකරණය යන විෂය ක්ෂේත්‍රයකින් ලබා ගත් ප්‍රථම උපාධිය

**සහ**

II. ප්‍රථම උපාධිය ලබාගැනීමෙන් පසුව රජයේ,රාජ්‍ය සංස්ථාවක,මණ්ඩලයක,ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එකක (01) ක පළපුරුද්දක් ලබා තිබීම.

**අතිරේක සුදුසුකම්**

පරිගණක භාවිතය පිළිබඳ හැකියාව හා ඉංග්‍රීසි භාෂාවෙන් රාජකාරි කටයුතු කිරීමේ හැකියාව අතිරේක සුදුසුකම් වේ.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත I හෝ II)**

I. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

II. ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ කණිෂ්ඨ කළමනාකාර (JM) සේවා ගණයේ තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**අතිරේක සුදුසුකම්**

පරිගණක භාවිතය පිළිබඳ හැකියාව හා ඉංග්‍රීසි භාෂාවෙන් රාජකාරි කටයුතු කිරීමේ හැකියාව අතිරේක සුදුසුකම් වේ.

**(4) . වයස**

අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**(5) . වැටුප් ක්‍රමය**

සේවා ගණයට අදාළ වැටුප් කේත අංකය හා මාසික වැටුප් පරිමාණය:

MM 1-2 - 2025 රු.94,170-10X2,480-15X3,450-170,720/=

**(6) . තනතුරට පැවරෙන කාර්යයන්**

- අභිමතාර්ථ සාධනය සඳහා සැළසුම් කර ඇති කාර්යයන් ඉටු කිරීම සඳහා ආයතනික පරිපාලනය කළමනාකරණ කටයුතු ඵලදායි ලෙස මෙහෙයවීම.
- භෞතික සම්පත් මනාලෙස කළමනාකරණය කිරීම,ආරක්ෂා කිරීම,නඩත්තුව හා ප්‍රවර්ධනයට අදාල වෙනත් රාජකාරි ඉටු කිරීම.
- ආයතනයේ පුහුණුව හා අධ්‍යාපනය ලබන පුහුණුලාභීන් හා ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ ආයතනික අවශ්‍යතා ඉටු කිරීම.
- ආයතනික කාර්යය මණ්ඩලය හා පුහුණුලාභීන් සඳහා සුභසාධන කටයුතු ඉටු කිරීම.
- නේවාසික සිසුන්ගේ විනය කටයුතු පාලනය.
- අධ්‍යක්ෂ ජනරාල්ගේ හා ලේඛකාධිකාරිගේ උපදෙස් පරිදි ආයතනික පරිපාලනය හා ශිෂ්‍ය සුභසාධනයට අදාල වෙනත් රාජකාරි ඉටු කිරීම.

**(7) . බඳවා ගැනීමේ ක්‍රමවේදය**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වා ප්‍රතිඵල මත තෝරා ගනු ලැබේ.

**(8) . ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදි ලකුණු ලබා දිමේ ක්‍රමය**

| | | |
|---|---|---|
| I | අදාල පළපුරුද්ද | - ලකුණු 30 |
| II | අදාල අමතර අධ්‍යාපන සුදුසුකම් | - ලකුණු 30 |
| III | අනෙකුත් කුසලතා/ කාර්යය සාධනයන් | - ලකුණු 15 |
| IV | සම්මුඛ පරීක්ෂණයේදි දක්වන ලද කුසලතාව | - ලකුණු 25 |
| | | **ලකුණු 100** |

අධ්‍යක්ෂ ජනරාල් හා ප්‍රධාන විධායක නිලධාරි (රා/ආ)

ජාතික සමුපකාර සංවර්ධන ආයතනය

පොල්ගොල්ල

2026.08.09